# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,875/2 — 1969 ඔක්තෝබර් 12 වැනි ඉරිදා — 1969.10.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1969 අංක 342**

අ. ආ. කා. අංක සී. 162/49 (7)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 51 වැනි වගන්තිය යටතේ වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ලංකා පරිපාලන සේවයේ කේ. පී. ජී. පෙරේරා මහතා 1969 ඔක්තෝබර් 12 වැනි දින සිට, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, පී. ඒ. සිල්වා මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, තම රාජකාරීවලට අමතරව වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. බී. ඇල්කඩුවේ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1969 ඔක්තෝබර් 12 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඨාලයේ දී.

10-819

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**රේගු නිවේදනය—අංක 61/9/411**

**ආදයම් සංරක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1969 ඔක්තෝබර් මස 13 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දැක්වේ.**

**මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි :—**

**රබර්**

| | | | |
|---|---|---|---|
| | | **රු.** | **ශ.** |
| **නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම—රාත්තලකට ...** | | **1** | **41** |
| **ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ...** | | **0** | **26** |

**ඒ. ඊ. පණ්ඩිතරත්න,**
**ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.**

**අංක ඡ.781,**
**1969 ඔක්තෝබර් 12 වන දින,**
**කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.**

10-821

3 A——ජ 6921—11,050 (69/10)

## රේගු දැන්වීම—අංක 67/3/98

1967 නොවැම්බර මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1969 ඔක්තෝබර් මස 13 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරා වල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,232.48 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ. :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අඹු පොල්ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව | |
|---|---|---|---|---|---|---|---|
| රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| 375 | 81 | 423 | 81 | 359 | 91 | 93 | 95 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි.

ඒ. ඊ. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22,
1969 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

10–820

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.